**මඩුල්ල ප්‍රාදේශීය සභාව**
**මොනරාගල දිස්ත්‍රික්කය**
**-----------------------------**

**1. <u>මූල්‍ය ප්‍රකාශන</u>**

**1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 15 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජුනි 23 දින ද සභාපතිවරයාට යවා ඇත.

**1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මඩුල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 <u>තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම</u>**

**(අ) <u>ගිණුම්කරණ අඩුපාඩු</u>**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| රු. 20,785 ක අයහාර වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේ දී නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

**(ආ) <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| රු. 171,396,859 ක් වූ ඉඩම් හා ගොඩනැගිලිවල ශේෂය තහවුරු කිරීමට තක්සේරු වාර්තා සහ අයිතිය තහවුරු කිරීමේ ලියවිලි විගණනය සඳහා ඉදිරිපත්කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරණ සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ඉදිරි වර්ෂය සඳහා තාවකාලික තක්සේරුවක් සිදු කරන බව දන්වමි. |

**1.4** **<u>අනුකූල නොවීම්</u>**

**<u>නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම</u>**

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත** | | | |
| 134(1) වගන්තිය | දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු අයකරගෙන නොතිබුණි. | පනතේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | දියුණු කළ ප්‍රදේශ හඳුනා ගෙන ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා සහකාර පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කර ඇති බව දන්වමි. |

## 2. <u>මූල්‍ය සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 3,027,670 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 1,312,403 ක් විය.

### 2.2 <u>ආදායම් පරිපාලනය</u>

#### 2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, බිල්පත් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම රු. | බිල් කළ ආදායම රු. | රැස්කළ ආදායම රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. | ඇස්තමේන්තුගත ආදායම් රු. | බිල් කළ ආදායම රු. | රැස්කළ ආදායම රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. |
| (i) | වරිපනම් හා බදු | 150,000 | - | 211,800 | - | - | - | - | - |
| (ii) | කුලී | 25,804,400 | 7,637,839 | 7,632,416 | 10,050 | 7,479,115 | 29,542,489 | 5,947,208 | 28,340 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 926,330 | - | 649,811 | - | 666,700 | - | 898,627 | - |
| (iv) | වෙනත් ආදායම් | 53,119,860 | 243,524 | 43,104,303 | 117,821 | 50,172,761 | 382,190 | 39,912,831 | 162,517 |
| | එකතුව | 80,000,590 | 7,881,363 | 51,598,330 | 127,871 | 58,318,576 | 29,924,679 | 46,758,666 | 190,857 |

**2.2.2** <u>ජල ගාස්තු ආදායම්</u>

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාලව රු. 117,507 ක් සහ ඉකුත් වර්ෂයට අදාලව රු. 93,823 ක හිඟ ජල ගාස්තු අයකරගෙන නොතිබුණි. | හිඟ ජල ගාස්තු අයකර ගත යුතුවේ. | ඉදිරියේ දී අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

**2.2.3** <u>කඩ කාමර කුලී ආදායම</u>

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාලව රු. 16,050 ක් සහ වර්ෂ 09 කට පෙර සිට පැවත එන රු. 40,800 ක හිඟ කඩ කාමර කුලී අයකරගෙන නොතිබුණි. | හිඟ කඩ කාමර කුලී අයකරගත යුතුවේ. | ඉදිරියේ දී අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

**2.2.4** <u>යන්ත්‍රෝපකරණ කුලියට දීමෙන් අයවිය යුතු ආදායම්</u>

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සභාවට අයත් බැකෝලෝඩර් යන්ත්‍රය 2018 සහ 2019 වර්ෂ තුළ කුලියටදීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 130,360 ක හිඟ කුලී ආදායම් අයකරගෙන නොතිබුණි. | හිඟ කුලී අයකරගත යුතුවේ. | 2018 වර්ෂයට අදාළ හිඟ අයකරගෙන ඇත. 2019 වර්ෂයට අදාළව අය විය යුතු රු. 42,380 ක් ඉදිරියේ දී අය කර ගැනීමට කටයුතු කරමි. |

**2.2.5** <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවති හිඟ උසාවි දඩ රු. 236,429 ක් හා හිඟ මුද්දර ගාස්තු රු. 3,213,513 ක් අයකර නොතිබුණි. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකරගත යුතුවේ. | ඉදිරියේ දී අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්ය සාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන්, ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්ම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය සඳහා සකස් කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන් ඇස්තමේන්තුගත වටිනාකම රු. 887,000 ක් වූ ක්‍රියාකාරකම් 04 ක් ඉටුකර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් ක්‍රියාකාරකම් ඉටුකළ යුතුවේ. | රු.25000 ක් වූ ක්‍රියාකාරකම් දෙකක් ඉදිරියේ දී ක්‍රියාත්මක කිරීමට නියමිත බවද, රු. 862,000 වූ ක්‍රියාකාරකම් 2 ක් සහා අරමුදල් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ඉටු කිරීමට නොහැකි වූ බව දන්වමි. |
| (ii) | සමාලෝචිත වර්ෂය සඳහා සකස්කර තිබුණු අයවැය ලේඛනය මගින් ප්‍රතිපාදන සලසා තිබුණු ඇස්තමේන්තුගත වටිනාකම රු. 32,064,810 ක් වූ කර්මාන්ත 04 ක් ඉටුකර නොතිබුණි. | අයවැය ලේඛනයෙහි ඇතුළත් ක්‍රියාකාරකම් ඉටුකළ යුතුවේ. | අපේක්ෂිත ප්‍රාග්ධන ආදායම් නොලැබීම හේතුවෙන් අදාල කර්මාන්ත ඉටු කිරීමට නොහැකි වූ බව දන්වමි. |

**(ආ) තිරසර සංවර්ධනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව එක්සත් ජාතින්ගේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව දැනුවත්වී තිබුණද, සභාවට අදාල කරගත හැකිවන පරිදි හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟාකර ගැනීමේ ප්‍රගතිය මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ලඟාකර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | 2020 වර්ෂයේ අරමුණු ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන ඉදිරි කටයුතු සිදුකරන බව දන්වමි. |

**(ඇ) <u>ඝන අපද්‍රව්‍ය කළමනාකරණය</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් රැස්කරන දිරන කසළ පෞද්ගලික ඉඩම්වලට බැහර කර තිබුණු අතර දිරන කසළ භාවිතා කර කාබනික පොහොර නිපදවීම ආරම්භකර නොතිබුණි. | කසළ කළමනාකරණය විධිමත් කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී කාබනික පොහොර නිපදවීමට කටයුතු කරන බව දන්වමි. |

**3.2 <u>මානව සම්පත් කළමනාකරණය</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තනතුරු 2කට අදාලව සේවක අතිරික්ත 03 ක් හා තනතුරු 4 කට අදාලව සේවක පුරප්පාඩු 5 ක් විය. | අතිරික්ත විධිමත් කිරීම හා පුරප්පාඩු පුරවා ගත යුතුවේ. | කාර්ය මණ්ඩල තුලනය කිරීමක් හා පුරප්පාඩු සම්පූර්ණ කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. |

**3.3 <u>වත්කම් කළමනාකරණය</u>**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | ප්‍රාදේශීය සභාවට අයත් ඉඩම් හා ගොඩනැගිලි නිශ්චිතව හඳුනා ගැනීමට සමීක්ෂණයක් සිදුකළ යුතුවේ. | 2020 වර්ෂය සඳහා සභාවට අයත් ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කරමි. |
| (ආ) | සභාවට අයත් විවිධ ප්‍රමාණයන්ගෙන් යුතු ඉඩම් 28 ක මැනීම් කටයුතු සිදුකර නොතිබුණු අතර ඉඩම් 61 ක නීත්‍යානුකූල අයිතිය පවරාගෙන නොතිබුණි. | සභාවට අයත් සියළු ඉඩම් මැනීම් කර නීත්‍යානුකූල අයිතිය පවරාගත යුතුවේ. | සියළු ඉඩම් මැනීම් කර නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | සභාවට අයත් පුස්තකාල 04 ක් විසින් 1994 සිට 2019 වර්ෂය දක්වා පාඨකයින්ට නිකුත්කර තිබුණු රු. 157,749 ක පිරිවැය වූ පුස්තකාල පොත් 753 ක් ලබාගෙන හෝ ඒ වෙනුවෙන් මුදල් | පාඨකයන්ට නිකුත්කළ පොත් නැවත ලබා ගැනීමට හෝ ඒ වෙනුවෙන් | සාමාජිකයින් හා ඔවුන්ගේ ඇපකරුවන් ලිඛිතව දැනුවත් කර ඇති |

| | | | |
|---|---|---|---|
| | අයකරගෙන හෝ නොතිබුණි | මුදල් ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | අතර මේ වන විට එම පොත් වලින් කොටසක් ලැබී ඇත. |
| (ඇ) | සභා බලප්‍රදේශයේ පිහිටා ඇති මාර්ග 452 ක් හඳුනාගෙන තිබුණද මාර්ග ඉන්වෙන්ට්‍රියක් සකස්කර ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කර නොතිබුණි. | මාර්ග හා මං මාවත් වලට අදාළ දැන්වීම් ගැසට් පත්‍රයෙහි පල කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කරමි. |

**3.4** <u>වාහන උපයෝජනය</u>

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සභාවට අයත් යන්ත්‍ර 2ක් සහ එක් වාහනයක් 2019 ජනවාරි 01 සිට අගෝස්තු 31 දක්වා කාල පරිච්ඡේදය තුල රු. 244,311 ක ඉන්ධන වියදම් දරා මීටර් පැය 496.3 ක් ධාවනය කර, කර්මාන්ත 69 ක් ඉටුකළ බව දෛනික ධාවන සටහන්වල දක්වා තිබුණි. එහෙත් එම කර්මාන්තවලට අදාළව නිමි වැඩ වාර්තා සහ ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණි. | ඇස්තමේන්තු හා නිමි වැඩ වාර්තා පිළියෙල කළ යුතුවේ. | ඉදිරියේ දී නිසි පරිදී ඇස්තමේන්තු සකස්කර නිමිවැඩ වාර්තා ලබා ගැනීමට කටයුතු කරමි. |

**3.5** <u>ප්‍රසම්පාදනය</u>

<u>ප්‍රසම්පාදන සැලැස්ම</u>

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා සකස් කර තිබුණු ප්‍රසම්පාදන සැලැස්මෙහි සඳහන් ඇස්තමේන්තු වටිනාකම රු. 439,000 ක් වූ ක්‍රියාකාරකම් 5 ක් ඉටුකර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුළත් ක්‍රියාකාරකම් ඉටුකළ යුතුවේ. | අපේක්ෂිත ආදායම් නොලබීම, ඉටු කිරීමේ අවශ්‍යතාවයක් ඇති නොවීම, ව්‍යාපෘති අවලංගු වීම වැනි හේතු දන්වමි. |

**4.** **ශිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1** **අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතුවේ. | දෙවන කාර්තුවේ සිට අභ්‍යන්තර විගණන කටයුතු සිදු කරන බව දන්වමි. |

**4.2** **විගණන හා කළමනාකරණ කමිටු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටු විය යුතුවේ. | 2020 වර්ෂය සඳහා පළමු විගණන හා කළමනාකරන කමිටු රැස්වීම 2020 ජුනි මාසයේ දී පැවැත්වීමට සැලසුම් කර ඇති බව දන්වමි. |